



චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---


ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

බහුදින යාත්‍රා සදහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබද පුරෝකථනය

# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

2024-12-16

| අක්ෂාංශ அகலாங்கு | | | දේශාංශ நெட்டாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | பாகம் |
| 10 | 2 | N | 87 | 18 | E | 28 |
| 15 | 59 | N | 89 | 18 | E | 51 |
| 0 | 18 | N | 82 | 43 | E | 71 |
| 0 | 8 | N | 62 | 44 | E | 41 |
| 0 | 9 | N | 64 | 28 | E | 41 |
| 0 | 35 | N | 66 | 25 | E | 40 |
| 0 | 18 | N | 68 | 59 | E | 45 |
| 0 | 39 | N | 65 | 57 | E | 36 |
| 0 | 55 | N | 67 | 16 | E | 36 |
| 0 | 0 | N | 83 | 45 | E | 72 |
| 0 | 33 | N | 86 | 57 | E | 73 |
| 0 | 34 | N | 87 | 48 | E | 75 |
| 0 | 22 | N | 89 | 1 | E | 61 |
| 0 | 17 | N | 77 | 43 | E | 62 |
| 0 | 37 | N | 60 | 28 | E | 37 |
| 0 | 35 | N | 60 | 56 | E | 31 |
| 2 | 58 | N | 83 | 43 | E | 54 |
| 0 | 51 | N | 66 | 32 | E | 43 |
| 1 | 45 | N | 68 | 46 | E | 42 |
| 0 | 30 | N | 69 | 15 | E | 46 |
| 1 | 7 | N | 64 | 29 | E | 35 |
| 0 | 43 | N | 87 | 13 | E | 73 |
| 0 | 34 | N | 82 | 48 | E | 67 |
| 0 | 28 | N | 77 | 46 | E | 62 |
| 9 | 34 | N | 63 | 39 | E | 40 |
| 9 | 33 | N | 61 | 42 | E | 41 |
| 5 | 56 | N | 61 | 23 | E | 21 |
| 2 | 22 | N | 59 | 52 | E | 18 |
| 0 | 39 | N | 60 | 59 | E | 31 |
| 0 | 24 | N | 63 | 7 | E | 41 |
| -4 | 58 | S | 88 | 55 | E | 32 |
| -2 | 21 | S | 78 | 30 | E | 43 |
| -2 | 28 | S | 76 | 42 | E | 42 |
| -6 | 56 | S | 84 | 16 | E | 32 |
| -7 | 19 | S | 86 | 14 | E | 30 |
| -4 | 39 | S | 86 | 19 | E | 27 |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය
## උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශ සඳහා
**(2024 දෙසැම්බර් මස 16 දින පෙ.ව. 07.00 ට ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)**

### දිවයින වටා වන මුහුදු ප්‍රදේශ

| |
|---|
| **විශේෂ දැනුම්දීම:** |
| **ගිණිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ඉදිරි පැය 24 තුල අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතින අතර එම පද්ධතිය තවදුරටත් සෙමින් වර්ධනය වෙමින් බටහිරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇත. ඉන් පසුව එළඹෙන දින දෙක තුලදී, එය දිවයිනේ උතුරුට ආසන්නව තමිල්නාඩු වෙරළ දෙසට ගමන් කිරීමේ හැකියාවක් පවතී.**<br><br>**බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව, මෙම පද්ධතිය සම්බන්ධව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.** |
| **වැසි තත්ත්වය:** |
| කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක. |
| **සුළඟ:** |
| පොතුවිල් සිට ත්‍රිකුණාමලය, කන්කසන්තුරය, පුත්තලම සහ කොළඹ හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමා එන අතර සුළඟේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය ක්ෂණිකව පැ.කි.මී. (50-60) පමණ දක්වා ඉහළ යාමට හැකි අතර කන්කසන්තුරය සිට පුත්තලම සහ කොළඹ හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. 50 පමණ දක්වා ඉහළ යාමට හැක.<br><br>සෙසු මුහුදු ප්‍රදේශවල සුළං නිශ්චිත දිශාවකින් තොරව හමන අතර වේගය පැ.කි.මී. (25-35) පමණ වේ. |
| **මුහුදේ ස්වභාවය:** |
| කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. කන්කසන්තුරය සිට පුත්තලම සහ කොළඹ හරහා ගාල්ල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු විටින් විට තරමක් රළු විය හැක. සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.<br><br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

### බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

**ගිණිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ඉදිරි පැය 24 තුල අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතින අතර එම පද්ධතිය තවදුරටත් සෙමින් වර්ධනය වෙමින් බටහිරට බරව වයඹ දෙසට ගමන් කරනු ඇත. ඉන් පසුව එළඹෙන දින දෙක තුලදී, එය දිවයිනේ උතුරුට ආසන්නව තමිල්නාඩු වෙරළ දෙසට ගමන් කිරීමේ හැකියාවක් පවතී.**

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 05N -15N, 80E-95E | : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| EQ -05N, 80E-100E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 10N-17N, 80E-100E | : නැගෙනහිර සිට ඊසාන දක්වා වන දිශාවලින් /පැ.කි.මී. (35-45), විටින් විට පැ.කි.මී. (50-60) දක්වා. |
| EQ-10N, 80E-95E | : වාමාවර්තව /පැ.කි.මී. (30-40), විටින් විට පැ.කි.මී. 50 දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ඊසාන දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (25-35). |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**මුහුදේ ස්වභාවය:**

10N-17N, 80E-100E : තරමක් රළු, විටින් විට රළු දක්වා.
EQ-10N, 80E-95E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

EQ -06N, 70E-80E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
06N -12N, 60E-80E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

**සුළං තත්ත්වය:**

05N-10N, 75E-80E : ඊසාන දෙසින් / පැ.කි.මී. (30-40), විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
07N-20N, 60E-70E : ඊසාන දෙසින් / පැ.කි.මී. (25-35), විටින් විට පැ.කි.මී.(45-55) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : වයඹ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (25-35).

**මුහුදේ ස්වභාවය:**

05N-10N, 75E-80E : තරමක් රළු, විටින් විට රළු දක්වා.
07N-20N, 60E-70E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

**කාලගුණික තත්ත්වය**

EQ- 10S, 80E-100E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

EQ-05S, 60E-100E : බස්නාහිර සිට නිරිත දක්වා වන දිශාවලින් / පැ.කි.මී. (30-40), විටින් විට පැ.කි.මී.50 දක්වා.
05S-10S, 60E-70E : දක්ෂිණාවර්තව / පැ.කි.මී. (30-40), විටින් විට පැ.කි.මී.50 දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (25-35).

**මුහුදේ ස්වභාවය:**

EQ-05S, 60E-100E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
05S-10S, 60E-70E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු.

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.